ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

**------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු වීම

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වීම

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු වීම

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව තහවුරු කල නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාසික ගිණුම් සාරාංශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් නොවන ලැබීම් රු. 480,085,286 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.464,499,639 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.15,585,647 ක් අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් නොවන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වීම. | එකඟ නොවේ. සමාලෝචිත වර්ෂය සඳහා මුදලින් ලද ආදායම් නොවන ලැබීම් රු. 462,329,338 කි. |
| (ආ) | මාසික ගිණුම් සාරාංශ අනුව තැන්පත් ලැබීම් රු.3,803,791 ක් හා තැන්පත් ගෙවීම් රු.3,824,268 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. එම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.20,477 ක් වැඩියෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව තැන්පතු, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වීම. | එය ඇතුලත් විය යුත්තේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම් වෙනස් වීම යටතේ බැවින් එහි මුදලින් කරන ලද ලැබීම් වූ රු.136,297 ක් හා මුදලින් ලද ගෙවීම් වූ රු. 3,795,537 හි වෙනස වූ රු. 3,659,060 ඇතුලත් කර මුදල් ප්‍රවාහය සංශෝධනය කරන ලදී. |
| (ඇ) | මාසික ගිණුම් සාරාංශ අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගෙවීම් රු. 21,313,532 ක් හා අත්තිකාරම් ආපසු අයකර ගැනීම් රු.23,447,712 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කල යුතු වීම. | අත්තිකාරම් ගෙවීම් හා අත්තිකාරම් ආපසු අයකර ගැනීම් ඇතුලත් කර ඇත්තේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේය. නමුත් උපණය අයකර ගැනීම් යටතේ මුදලින් අයකිරීම් වශයෙන් රු.318,658 ද, අනෙකුත් ආයෝජන යටතේ රු.14,753,184 ද, ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සංශෝධනය කරන ලදී. |

## 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ 2018 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව විශ්‍රාම ගිය නිලධාරීයෙකුගෙන් අයවිය යුතු රු.121,237 ක ශේෂයක් වසර 02 කට ආසන්න වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම | 2017 මාර්තු 29 දින විශ්‍රාම ගොස් ඇති මෙම නිලධාරිණියගේ ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමේදී අයකර ගැනීමට සටහන් කරගෙන ඇති නමුත් විශ්‍රාම ගැන්වීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන පෞද්ගලික ලිපිගොනුවට භාර නොදීම හේතුවෙන් අදාළ ලිපි ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මේ දක්වා යොමු කර නොමැත. |

## 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ගොඩනැගිලිවල සියලුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ ලේඛනගත කිරීමෙන් ඒවායේ ආරක්ෂාව තහවුරු කර ගත යුතු වීම. | ඉදිරියේදී සකස් කිරිමට කටයුතු කරමි. |

(ආ) හානි පිළිබඳ ලේඛනය

-----------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබද ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | රෙගුලාසියේ සඳහන් පරිදි අනාවරණය වූ ඌනතාවයන් හානි පිළිබඳ ලේඛනයේ සටහන් කළ යුතු වීම. | ඉදිරියේදී හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කරමි. |

(ඇ) බැරකම් පිළිබඳ ලේඛනය

--------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වීම. | බැරකම් ලේඛනය සිගාස් වැඩසටහන යටතේ මේ වන විටත් නඩත්තු වන බැවින් වෙනම ලේඛනයක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන බව පෙන්වා දෙමි. |

(ඈ) උප පත්‍රිකා පොත් ලේඛනය

----------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ජී.ඒ.එන්. 20 ආකෘතිය පරිදි උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

(ඉ) වාහන ලොග් පොත

---------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. | ලොග් සටහන් පොත් යාවත්කාලීන කල යුතු වීම. | අතපසුවීම් මත සමහර සටහන් ලොග් පොතට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති අතර හැකි ඉක්මනින් එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය<br>නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(4) | අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත්, 2018 මැයි හා 2018 පෙබරවාරි අනතුරට පත් වාහන දෙක සම්බන්ධයෙන් පූර්ණ වාර්තා 2019 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන්මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. | නිසි අවධානයෙන් තොරව කටයුතු කිරීම නිසා මෙම අනතුර සම්බන්ධයෙන් අවසන් කළයුතු පරීක්ෂණ නිසි කාලවකවානු තුලදී සිදු වී නැත. ඉදිරියේදී පරීක්ෂණ මුදල් රෙගුලාසි 104(4) අනුව කටයුතු කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර ඇත. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කලයුතු වුවත් වාහන 35 ක එලෙස ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදු කල යුතු වීම. | එක් වාහනයක ඉන්ධන පරීක්ෂාව කරන ලද නමුත් අතපසුවීමකින් ලොග් සටහන් පොතේ සටහන් කර නොමැති බවත් ඉන්ධන පරීක්ෂාවන් කිරීමට නොහැකි වූ සහ ඉන්ධන පරීක්ෂා කරන ලද කාලසීමාව ඉක්ම වූ සියලු වාහනවල ඉන්ධන පරීක්ෂාව නියමිත පරිදි ඉදිරියේදී සිදු |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2015 ජුලි 14 දිනැති අංක 04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | වෙළඳපල තුළ ක්‍රියාත්මක ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රජය සතු ආයතන වෙතින් මිල ගණන් කැඳවීම තුලින් රක්ෂණ ආවරණයක් සලසා ගත යුතු වුවත්, එවැනි මිල ගණන් කැඳවීමකින් තොරව දෙපාර්තමේන්තුව සතු වාහන 14 ක් රක්ෂණභාර අරමුදලෙන්ද, අනෙක් වාහන 25 ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන්ස් ලිමිටඩ් වෙතින්ද, පූර්ණ රක්ෂණය කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එකඟ වෙමි. මින් ඉදිරියට මෙම දෙපාර්තමේන්තුව සතු සියළු වාහන සඳහා 04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රජය සතු ආයතන වෙතින් මිල ගණන් කැඳවීම තුලින් රක්ෂණ ආවරණ සලසා ගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 වියදම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු.5,685,000 ක ප්‍රතිපාදනයෙන් රු.1,688,338 ක් එනම් සියයට 30 ක් ඉතිරි වී පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | දේශීය ගමන් වියදම් සීමා කිරීමෙන්ද, නිල ඇඳුම් දීමනාව සඳහා අමතර නිලධාරීන් දෙදෙනෙකුට ඇස්තමේන්තු සකස් කිරීමෙන්ද, කැබ් රථ 03 ක් වර්ෂය තුල නිසි පරිදි ධාවනයට නොයෙදවීමෙන්ද ප්‍රතිපාදන ඉතිරි විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

(අ) දෙපාර්තමේන්තුව විසින් 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. එම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී පහත අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්ක පිහිටුවීමේදී දෙපාර්තමේන්තුව සතු සම්පත්වල ධාරිතාවය හා ශක්‍යතාවය යනාදී සාධක සැලකිල්ලට ගැනීමෙන් සිදු කල යුතුයි. එසේ වුවද, එම කරුණු කෙරෙහි අවධානය යොමු නොකර සැලසුම් සකස් කිරීම නිසා ඉලක්කගත ප්‍රමාණය ඉක්මවා කාර්යය සාධනය සියයට 114 ක සිට සියයට 152 ක් දක්වා පරාසයකින් වැඩි වී තිබුණි. | ඉලක්ක පිහිටු වීමේ දී පෙර වර්ෂයේ ප්‍රගතිය , ආයතනයේ ශක්‍යතාවය යනාදී අත්‍යවශ්‍ය සාධක සලකා බැලිය යුතු වීම. | දෙපාර්තමේන්තුව ඉලක්ක ගොඩනගා ගනු ලබන්නේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ඉලක්ක පදනම් කරගෙන වේ. 2018 වර්ෂයේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ඉලක්කය ඉඩම් කැබලි 96,000 ක් වූ බැවින් ඊට සාපේක්ෂව දෙපාර්තමේන්තුවෙහි ඉලක්ක සැලසුම් කර ඇත. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ සමාලෝචිත වර්ෂයේ මැන වෙන්කිරීම් පරීක්ෂා කිරීමේ ඉලක්කය ගම් 15 ක් වුවද, ගම් 05 ක පමණක් පරීක්ෂා කිරීම් අවසන් කර තිබුණි. | සැලසුම් කළ පරිදි ඉලක්කයන් ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉඩම්වල සිතියම් සකස් කිරීම දිගින් දිගටම ප්‍රමාද වීම නිසා පනතේ ප්‍රධාන පියවරයන්හි 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී ප්‍රගතිය වෙනස්ව ඇත. |
| (ආ) | බිම්සවිය වැඩසටහන 2002 වර්ෂයේ ආරම්භ කර 2021 වර්ෂය අවසන් වනවිට නිම කිරීමට මූලිකව සැලසුම් කර තිබුණි. එසේ වුවත් සමාලෝචිත | සැලසුම් කළ පරිදි ඉලක්කයන් ලඟාකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ | ග්‍රාම නිලධාරී කොට්ඨාශ 3659 ක් පැවතියද, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ හා මෙම දෙපාර්තමේන්තුවේ සම්පත් |

| | | |
|---|---|---|
| වර්ෂය අවසන් වනවිට වර්ෂ 16ක් ගතවී තිබුණත් එම වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 57 ට අයත් මුළු ග්‍රාම නිලධාරී කොට්ඨාශ 3659 න් මිණුම් කටයුතු අවසන් කර තිබුණේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 1695 ක එනම් සියයට 46 ක පමණි. | යුතු වීම. | යෙදවීමේ ශක්‍යතාවය හා කාර්ය මණ්ඩලවල ධාරිතාවයත් අනුව වැඩ කටයුතු ආරම්භ කරන ග්‍රාම නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව සීමා කිරීමට සිදු වි ඇත. |
| (ඇ) හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාව අතරතුර 2018 වර්ෂයේදී ලිපිගොනු 34,428 ක් පසෙක තබා තිබූ අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට එසේ පසෙක තැබූ සමස්ත ගොනු සංඛ්‍යාව 414,543 ක් වී තිබුණි. මෙලෙස පසෙක තබන ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂ වැඩපිළිවෙලක් සකස් නොකිරීම හේතුකොට ගෙන නිරවුල් කිරීමේ කාර්යයන් ඉටු කිරීම ප්‍රමාද වී තිබුණි. | පසෙක තැබූ ගොනු පිළිබඳව කටයුතු කිරීමට කඩිනම් වැඩ පිළිවලක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. විමර්ශන ක්‍රියාවලියේදී ගැටළු සහිත ලිපිගොනු පසෙක තැබීමට සිදුවන අතර, පසෙක තැබූ ගොනු නැවත විමර්ශනය කිරීමෙන් පසු තවදුරටත් ගැටලු සහගත නම් නැවතත් පසෙක තැබීමට සිදු වේ. |

3.3 වත්කම් කළමනාකරණය
---------------------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ධාවනය කල නොහැකි තත්ත්වයේ වාහන අපහරණය කිරීමට හා අළුත්වැඩියා කල හැකි වාහන අළුත්වැඩියා කර ධාවනයට යෙදවිය යුතුයි. එසේ වුවද ජීප් රථයක් වර්ෂය පුරාම ධාවනය නොකර නිෂ්කාර්යව පැවති අතර අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම රථය 2018 වර්ෂයේ අළුත්වැඩියා කර ධාවනය සඳහා යෙදවීමට අදහස් කර තිබූ බැවින් ඊට අදාල රක්ෂණ කටයුතු සිදු කරන ලදී. නමුත් අමාත්‍යාංශ ලේකම් විසින් මෙම වාහනය අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් අවාසිදායක බව පවසා අළුත්වැඩියාවට අනුමැතිය ලබා දී නොමැත. |

3.4 පාඩු හා හානි

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයෙන් ප්‍රධාන කාර්යාලයේ අංශ 03 කට අදාළවත්, ප්‍රාදේශීය කාර්යාල 14 කට අදාළවත්, අනාවරණය වූ පරිගණක හා උපාංග 72ක්, ලී බඩු හා කාර්යාල උපකරණ 34ක් හා විදුලි උපකරණ 08 ක් ද ඇතුළුව භාණ්ඩ ඌනතාවයන් 151 ක පිළිබඳව මුදල් රෙගුලාසි 104 හා 105 ප්‍රකාරව අලාභයට වගකිව යුත්තන් නිශ්වය කර අලාභ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අලාභ හානි සම්බන්ධයෙන් පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි ද දක්වා නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වන ඌනතාවයන් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණය මගින් අනාවරණය වී ඇති ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් අදාළ අංශවලින් කරුණු විමසා ඇති අතර එම හේතු ලද පසු ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ලබාදීමට කටයුතු කරමි. |

4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2112 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 825 ක් එනම් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 61 ක් පුරප්පාඩු වී පැවතුණි. ප්‍රාදේශීය කාර්යාල 90 ක් පවත්වාගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන තිබුණද වර්තමානයේ ප්‍රාදේශීය කාර්යාල 43 ක් පමණක් පවත්වාගෙන යාම තුළ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු නොකිරීම මෙලෙස විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීමට හේතු වී තිබුණි. | ප්‍රාදේශීය කාර්යාල 43 ට අනුගත වන පරිදි කාර්ය මණ්ඩලය සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතු වීම. | වර්තමාන සේවා තත්ත්වය අනුව කාර්යාල 43 ක් වෙනුවෙන් නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලබාගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. |